**www.wsws.org** | **ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

**හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය**

ලංකාවෙන් ස්ථානයේ සිට වාර්තාවක්

# වෛද්‍ය කන්ඩායමක් සමග හම්බන්තොට සේවය

***On-the-spot report from Sri Lanka***
**Working with a medical team in Hambantota**

**අජිත ගුනරත්න විසිනි**
**2005 ජනවාරි 03**

---

මුලු දිවයිනම කලඹවමින් නොසිතූ පරිදි ඇතිවූ අතිවිශාල සුනාමී ඛේදවාචකයේ ආරම්භයත් සමග ම කොලඹ ජාතික රෝහලේ වෛද්‍යවරු සහ හෙද කන්ඩායම් ඇතුලු සිය ගනනින් සෞඛ්‍ය සේවකයෝ ක්ෂනික සහන සේවා සඳහා පෙල ගැසුනාහ. රජයේ වෛද්‍ය නිලධාරී සංගමය (ර.වෛ.නි.ස) සහ හෙද කන්ඩායමක් එක්ව ව්‍යසනයට ලක් වූ ප්‍රදේශවලට සහන සේවා කන්ඩායම් පිටත්කර හරින අතරතුරේ ශ්‍රී ලංකා ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයේ අධ්‍යක්ෂ කාර්යාලය සහ විශේෂ ශ්‍රේනියේ හෙද නිලධාරිනී කාර්යාලය ඒ සඳහා කටයුතු සම්බන්ධීකරනය කරන ලදී. රජයේ අනුග්‍රහය සහ සම්බන්ධීකරනයකින් තොරව තමන්ගේ ම මූලිකත්වයෙන් මෙම කටයුතු කරගෙන යෑමට ඔවුනට සිදු විය.

සුනාමි ඛේදවාචකය ඇති වූ දින එනම් දෙසැම්බර් 26 වැනි දින ර.වෛ.නි.ස මගින් ආන්ඩුවේ ආපදා කලමනාකරන මධ්‍යස්ථානය සම්බන්ධ කර ගත්තද ඒ වන විටත් වෛද්‍ය සහන කන්ඩායම් අවශ්‍ය ප්‍රදේශවලට යොමු කරලීම සම්බන්ධයෙන් ඵලදායී සැලසුමක් එමගින් ආරම්භ කර නො තිබිනි. කෙසේ වෙතත් ඒ වන විටත් රජයේ සෞඛ්‍ය සේවක නිවාඩු අවලංගු කර තිබුනි. එබැවින් සෞඛ්‍ය සේවකයෝ රාත්‍රියේදීත් සහන සේවා මධ්‍යස්ථානය වටා එක්රැස් වූහ. හෙද හෙදියන් පිරිසක් රත්මලාන ගුවන් තොටුපලට රැගෙන ගියද සමහරුනට එකදු ව්‍යසනයට ලක්වූ ප්‍රදේශයකටවත් යෑම සඳහා ගුවන් යානයක් නොතිබූ නිසා නැවත හැරී ඒමට සිදුවිනි.

පසුදින වන විටත් රජයට කිසිදු සැලසුමක් නොමැති බව පැහැදිලිව දිස්වූයෙන්, වෙනත් අය මෙන් ම, ශ්‍රී ලංකා ජාතික රෝහලේ හෘද උරස් ශල්‍ය ඒකකයේ වෛද්‍ය හා හෙද කන්ඩායම් ද කලයුත්තේ කුමක් දැයි සාකච්ඡා කලහ. අනතුරුව එක් නියෝජිතයෙක් සාමාන්‍ය ශල්‍යකර්ම තාවකාලිකව නතර කර අදාල සේවක කන්ඩායම් සුනාමි ව්‍යසනයට ලක්වූ ප්‍රදේශවලට ක්ෂනික සහන සේවා සඳහා යොමු කරවන ලෙස ඉල්ලා සිටීමට රෝහල් අධ්‍යක්ෂවරයා හමු විය. නමුත් රජයේ යොමු කිරීමකින් තොරව එවැන්නක් කිරීමට ඔහු පැකිලුනේ ය. අවසානයේ මෙය ලියන කතුවරයාද ඇතුලුව හෙද නිලධාරීන් තිදෙනෙකු අනිකුත් සෞඛ්‍ය සේවකයින් 16 දෙනෙකුද සමගින්, ආධාර සඳහා මංමුලාසහගතව බලාපොරොත්තුව සිටි, දිවයිනේ දකුනු පලාතේ හම්බන්තොට මූලික රෝහල බලා යාමට පිටත් වූහ.

විශේෂඥ වෛද්‍යවරයෙක්, නිර්වින්දන වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරින් හා හෙද නිලධාරීන්ගෙන් සමන්විත අප කන්ඩායම පෙ.ව. 11.00ට පමන රත්මලාන ගුවන් තොටුපලට පැමිනීමට සමත්විය. හැකි ඉක්මනින් හම්බන්තොට බලා යෑමට අපට අවශ්‍ය වුවත් ප.ව. 4.30 වන තුරුත් ගුවන් යානයක් බලාපොරොත්තුවෙන් අපිට එහි රැඳී සිටීමට සිදු විය. එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයේ ප්‍රධානියෙකු වූ අලෙවි මවුලානා ගුවනින් යෑම සඳහා පැමිනෙන තුරු අප එහි රඳවා ගැනීමට ගුවන් හමුදාවට උපදෙස් ලැබී තිබුනි. එසේම හමුදා මුදවා ගැනීමේ සේවකයෝද ගුවනින් යෑම සඳහා එහි රැඳී සිටියහ.

හම්බන්තොටින් කි.මී. 20ක් දුරින්වූ වීරවිල ගුවන් හමුදා අංගනය දක්වා වූ ගුවන් ගමනේ දී සුනාමි ව්‍යසනයේ දැවැන්ත පරිමාව පිලිබඳව අවබෝධයක් ලබා ගැනීමට අපට හැකි විය. මුහුදු බඩ විශාල ප්‍රදේශයන් මුලුමනින්ම විනාශ වී තිබිනි. දහස් ගනනින් නිවාස, දුම්රිය පාර, දුම්රිය මැදිරි, කොලඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ බොහෝ කොටස්, ගාල්ල නගරය උදම් දල රල පහරට හසුව සුනු විසුනු වී ගොස් තිබිනි. ඒ තත්වය අප සිතුවාට වඩා බොහෝ සෙයින් වෙනස් වූ ඛේදජනක බියකරු දර්ශනයක් විය.

ඉන් පසුව හම්බන්තොට මූලික රෝහල බලා අප වාහනයෙන් යන ගමනේ දී නටබුන් බවට පත්වූ නගරයක බියකරු දසුන් අපි දුටිමු. බොහෝමයක් නිවෙස්, පල්ලි, රාජ්‍ය ආයතන හා අනෙකුත් ගොඩනැගිලිද වඩ දිය රැල්ලට හසුව විනාශවී පැවති අතර වාහන පෙරලී ඇඹරී ගොස් තිබුනි. ප්‍රදේශයේ වෘක්ෂලතා, නිවෙස්වල බොහෝ දෑ මෙන්ම වහලවල් සැඩ පහරින් ගසාගෙන ගොස් තිබින. රෑ බෝවෙමින් තිබුන ද වෙහෙසට පත් හමුදා සෙබලු සුන්බුන් අතර හිරව තිබූ සිරුරු සොයමින් සිටියහ. මල සිරුරු තැන් තැන්වල වැටී තිබෙනු දකිත හැකි විය. වඩාත් හද කකියන දසුනක් වූයේ මංමුලා සහගතව තම පවුල්වල

නැතිවූ සාමාජිකයින් හා ඥාතීන් සොයන මිනිසුන්ගේ දර්ශනයයි. අපි සියලු දෙනාම එකම දෙය සිතුවෙමු: මෙය (සුනාමි රල) කලින් අනතුරු ඇඟවිය හැකිව තිබුනි.

හම්බන්තොට නගරයේ උසම ස්ථානයක මූලික රෝහල පිහිටා තිබුනු බැවින් සුනාමි රල පහරින් බේරී සිටීමට ඊට හැකි වූ අතර ඒ අවට වූ නිවාස හා රාජ්‍ය ආයතනවලට ද එමගින් හානි සිදු වී නොතිබුනි. නමුත් ඉන් දුරක් ඔබ්බෙන් පැවති සියලු ගොඩනැගිලි ඇතුලු අනෙකුත් දෑ මුලුමනින්ම විනාශ වී පැවතුනි. රෝහල් භූමියට ඇතුලුවනවාත් සමගම අප්‍රසන්න දුර්ගන්ධයකින් අපිව වෙලා ගන්නා ලදී. රුධිරය සහ මඩ දසත විසිර තිබුනි. දුර්ගන්ධය විහිදෙමින් තිබුනේ රෝහල් භූමියේ එක් පසෙක ගොඩ ගොඩ ගසා තිබූ මල මිනීවලිනි. මෙම ඛේදවාචකයේ බිහිසුනු පරිමාව මගින් නිසැකයෙන්ම එහි සේවකයෝ අන්දමන්ද වී සිටියහ.

එක් රෝහල් සේවකයෙකු ඔවුන් පත්ව සිටි තත්වය මෙසේ විස්තර කලේ ය. ''වෛද්‍යවරුන්, හෙදියන්, අතුරු වෛද්‍ය සේවකයින් ඇතුලු සේවකයින් බොහෝ දෙනෙක් අපිට අහිමි වුනා. සමහර අයගේ පවුල්වල සාමාජිකයන් අහිමිවෙලා. සමහරුන් බඩුබාහිරාදිය නිවාස ආදිය නැතිවීම නිසා සේවයට වාර්තා කරලා නැහැ. මෙම ව්‍යසනයට කලිනුත් අපේ රෝහලේ සේවක හා අනෙකුත් පහසුකම්වල හිඟයක් පැවතුනා. මේ අවස්ථාවේ කුමක් කරන්නදැයි අපි දැන සිටියේ නැහැ. හේතුව අනතුරට පත්වූ අය වැල නොකැඩී රෝහලට පැමිනෙන්නට පටන් ගත්තා. අපට සහන සේවා ලැබුනේ ප්‍රමාදවෙලා.''

අප වෛද්‍ය සහන සේවා කන්ඩායම රාත්‍රී 7.30ට පමන සේවා කටයුතු ඇරඹී ය. වාට්ටුවල රෝගීන් පරික්ෂා කරමින් යද්දී වේදනාවෙන් කෑගසන රෝගීන් අපි දුටුවෙමු. සියලුදෙනාම තම ආදරනීයයන් අහිමිවීම නිසා වැලපෙමින් සිටියහ. බොහෝ දෙනාගේ දේපල සියල්ල අහිමිවී ගොසිනි. රෝගීහු, ඉරීගිය කිලිටි ඇඳුම් සහිතව, මඩ හා වැලි තැවරුනු විවෘත තුවාල සහිතව සිටියහ. ලෙයින් තෙත්වූ ඇතැමුන් ඇඳ ඇතිරිලි නොමැති කිලිටි මෙට්ට මත දිගාවී සිටියහ.

බොහෝමයක් තුවාල ඒ වන විටත් ආසාධනයට ලක්ව පැවති අතර ඒවාට ප්‍රතිකාර කිරීමද අපහසු කාර්යයක් විය. ජෙන්ටාමයිසින් (Gentamicin), සිෆිව්රොක්සිම් (Cefuroxime) වැනි මූලික ප්‍රතිජෛවක ඖෂධවත් එහි නොතිබිනි. එසේම රෝගීන්ගෙන් බොහෝ දෙනෙකු පිටගැස්මට එරෙහිව එන්නත් කොට තිබුනේ නැත. සමහර වාට්ටුවල ඉබිව්ප්‍රොෆේන් (Ibuprofen) හා ඩික්ලොෆෙනැක් සෝඩියම් (Diclofenac Sodium) වැනි වේදනා නාශක ඖෂධ පවා නොමැති නිසා දැඩි කායික හා මානසික වේදනාවෙන් පීඩිත රෝගීහු වැලපෙමින් සිටියහ. එසේම තුවාල වූවන්ට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන්වන ගෝස් පුලුන් සැරහුම් මෙන්ම තුවාල සුද්ධ කිරීම සඳහා අවශ්‍ය ප්‍රොවිඩෝන් අයඩීන් (Povidone Idine) (බෙටාඩීන්) වැනි ද්‍රාවනවලද හිඟයක් පැවතුනි.

අප කන්ඩායම් නායකයාට සමහර අවස්ථාවල ස්ථානෝචිතව අසීරු තීරන ගැනීමට සිදු විය. වස පානය කල දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටි රෝගියෙකු ඉන් ඉවත්කර සුනාමි ව්‍යසනයෙන් දරුනු ලෙස රෝගාතුර වූ අයෙකු එහි ප්‍රතිකාර සඳහා යොමු කිරීමට සිදු වූයේ වෙනත් හිස් ඇඳක් එම කුඩා දැඩිසත්කාර ඒකකයේ නොතිබුනු බැවිනි.

හෙද සේවකයෙකු මෙසේ ප්‍රකාශකලේ ය. ''අවශ්‍ය තරම් චූෂන නල (Suction Catheatres), අත්වැසුම්, ග්ලුටරල්ඩිහයිඩ් (Gluteraldyhide) (cidex) (විශබීජ හරනය කිරීමේ ද්‍රාවනයකි - පරිවර්තක) සහ අනෙකුත් අවශ්‍ය දේවල් නැහැ. සේවා අඛන්ඩව පවත්වා ගෙන යාම සඳහා ප්‍රමානවත් කාර්ය මන්ඩලයක්ද අපිට නැහැ.''

රෝගීන්ගේ පීඩාවන් හුරු කිරීමට වෙර දරන, එක දිගට දිගු කාලයක් සේවයේ නියුතුව සිට වෙහෙසට පත් හෙද හෙදියන් මෙන්ම අනෙකුත් සෞඛ්‍ය සේවකයන් අපි දුටිමු. එසේම දරුනු දුගඳ නිසාවෙන් කුඩා රෙදිකඩවලින් නාස් ආවරනය කරගනිමින්, වාට්ටුවෙන් වාට්ටුවට යමින් රෝගීන්ගේ මුහුනුවලට එබී බලමින් තම නැතිවූ පවුලේ සාමාජිකයින් සොයන මිනිසුන් අපට දර්ශනය විය.

සෙබල බල ඇනි දවස පුරා ම රෝහලේ තිබූ මෘත ශරීර ඉවත්කිරීමේ කටයුතුවල නියැලී සිටියහ. කෙනෙකු පැවසුවේ ඉදිමී ඕජස් ගලමින් තිබූ නිසා මල මිනී එසවීම පවා කල නොහැකිව තිබූ බව යි. පසුව ඒවා බැකෝ යන්ත්‍රවල ආධාරයෙන් වාහනවලට පටවා විශාල සමූහ මිනීවලවල් කපා භූමදාන කරන ලදී.

ස්වේච්ඡා කන්ඩායම් රෝහලට පැමින මූලික ද්‍රව්‍යයන් වන පානීය ජලය, කෑම බීම, ඇඳුම් පැලඳුම් පරිත්‍යාග කලහ. තමාට ලැබුනේ ළමා ඇඳුම් ය යි එක් මහලු අයෙකු චෝදනා කරනු ඇසුනි. අනෙක් අය තමන්ට ලැබුනු ඕනෑම දෙයක් වෙනුවෙන් කෘතඥතාව පුද කලහ. හදිසි සහන සේවා සඳහා පිට පලාත් සඳහා නික්ම ගිය ස්වේච්ඡා සෞඛ්‍ය සේවක කන්ඩායම් සඳහා ආහාර හෝ අනෙකුත් අවශ්‍ය දෑ සැපයීම රජය විසින් සිදු නොකල හෙයින් අපි සියලු දෙනාමත් එම සහනාධාර මත යැපුනෙමු.

මෙහිදී අප ශල්‍ය සහන සේවා කන්ඩායමට දුෂ්කරතා රැසකට මුහුන දීමට සිදුවිනි. අවශ්‍ය තරම් ඉන්ධන නොමැති වූ නිසා රෝහලේ විදුලි ජනක යන්ත්‍රය වරින්වර ක්‍රියා විරහිත වීමෙන් හදිසි සැත්කම් පවා කල් දැමීමට සිදු විය. විවේකයේ දී මෙම තත්වය පිලිබඳව උරනවූ වෛද්‍යවරු සහයෝගයක් නොදීම හා සැලසුම් නොමැතිකම පිලිබඳව රජයට දොස් නැගූහ. ''ආන්ඩුව වෙනත් රටවලින් වෛද්‍ය කන්ඩායම් ඉල්ලා සිටිනවා නමුත් තවමත් ඔවුන් කොලඹ සිටින ස්වෙච්ඡා වෛද්‍යවරුන් අවශ්‍ය තැන්වලට යවලා නැහැ. ''

දෙසැම්බර් 28 වෙනිදා අප මුදා හැරීම සඳහා තවත්

සහන සේවා කන්ඩායමක් පැමිනියේ ය. ඔවුන්ටද අපට මෙන්ම ගමනාගමන ප්‍රමාදවීම්වලට ලක්වන්නට සිදුවූයෙන් උදෑසන පිටත්වූ ඔවුන් එහි ලගාවුනේ රෑ බෝවීය. රාත්‍රිය මුලුල්ලේද සේවය කිරීම නිසා පසුදා උදෑසන අපි පිටත්ව එන විට වෙහෙසට පත්ව සිටියෙමු. අපහට ගමනාගමන පහසුකම් සලසා නොතිබූ බැවින් බස් මගින් ආපසු ඒමට තීරනය කලෙමු. ආපසු ගමන ද අප හද සසල කරවන්නක් විය. හම්බන්තොට නුදුරු ජලාශවල ඒවන විටත් මලමිනී පාවෙමින් තිබිනි. මිනිසුන් ආහාර සහ පානීය ජලය සොයා සරනාගත කඳවුරුවල එලියේ රැස්කකා සිටියහ.

බසයේදී වන ජීවී දෙපාර්තමේන්තුවේ අයෙකු අපිට මෙසේ පැවසුවේ ය. ''අද ජීවිත බේරාගැනීමේ කන්ඩායම් යාල අභය භූමියේ දී දරුනු තුවාල සහිත අවුරුදු 7ක පිරිමි දරුවෙකු සොයාගෙන තිබෙනවා. කැඩී බිඳී ගිය බෝට්ටුවක පාවෙමින් සිට මිනිසෙකුත් හමුවී තිබෙනවා. ආන්ඩුව තවමත් ජීවතුන් අතර සිටින අය සොයන්න වැඩිපුර මුදවා ගැනීමේ කන්ඩායම් නොයොදන්නේ ඇයි.''

කොලඹ පැමිනි පසු, දකුනු පලාතේ සුනාමි ඛේදවාචකයට මුහුනදුන් තවත් නගරයක් වූ මාතර සිට පැමිනි වෛද්‍යවරයෙකු හා අත්දැකීම් හුවමාරු කර ගත්තෙමු. ප්‍රතිකාර ඉක්මනින් නොලැබුනොත් බොහෝ රෝගීන් මිය යාහැකි බවට ඔහු අනතුරු ඇඟවීය. ''බොහෝමයක් දෙනා තවමත් විවෘත තුවාල සහිතව සිටිති. දියවැඩියාව, අධික රුධිර පීඩනය, හෘද රෝග, ඉහල ස්වසන මාර්ගයේ ආසාදන සහිත රෝගීහු එහි සිටිති. වසංගත පැතිරයාමේ අනතුරට අමතරව නිසි ප්‍රතිකාර ලබා නොදුනහොත් මෙම රෝගී තත්වයන් ද උග්‍ර අතට හැරෙනු ඇත.''

© www.wsws.org